# පහතරට තොවිල් කවිය

**තංගල්ලේ සු. හැ. ජ. සුගුණසිරි විසිනි**

ගඟ දිගේ පහළට ගසාගෙන යනු ලබන ගල් කැටක් කල් යාමේ දී වෙනත් ගල් කැටවලත් ගල් පරවලත් හැපෙමින් අස්කොන් කැපී කෙටී මටසිළුටු වී ඔපයක් ලැබුවේ ඉබේ ම මිස කා ගේ වත් ඕනෑකමක් අනුදැනුමක් පිට නොවේ. ඇතැම් විට කිහිප දෙනෙකු ගල් කැටක් ගෙන තමතමන්ට අභිමත පරිදි ඔපමට්ටම් කරන්නට ගියේ නම් ගල් කැට අර ඉබේ ලැබූ ඔපය නො ලැබී යාමට ඉඩ තිබේ.

පහතරට තොවිල් කවියට ද සිදු වී ඇත්තේ මේ පසු ව කී ටික යැ යි හැඟේ. සිංහළ ජනකවිය ගඟ දියෙන් ගසාගෙන යන කැට මෙන් කා ගේ වත් හවිහරණයක් අනුදැන්මක් නැති ව අවුරුදු දහස් ගණනක් මුළුල්ලේ ඒ ඒ සමාජ පරවල හැපෙමින් ඔපමට්ටම් වී ගියේ ය. අවුරුදු දහස් ගණනක් තිස්සේ පැවැත එතැයි සැලැකිය හැකි තොවිල් කවිය ජනකවිය තරම් රසයක් ගෙන නො දෙන්නේ යම් යම් ගුරුකුල විසින් එය කිසියම් ස්වරූපයකට බැඳ තැබීමට ගත් උත්සාහය නිසා යැ යි හැඟෙයි. ගුරුන්නාන්සේ කියන්නේ යමක් ද කොයි ආකාරයකට ද ගෝලයා ද එය ම අනුකරණය කිරීම ගුරුකුලයක සිරිති. නාග කන්‍යා නැටුමේ එන—

කරන විස නිස් සා
දස දෙස බලයි ගස් සා
නටන ලෙස නිස් සා
පැනපි නාගා මහරකුස් සා

යන්න කොයි තරම් කාලාන්තරයක් මුළුල්ලේ කීව ද එය වෙනස් නො වී එක් ම වචන සමුදායකින් එක් ම ආකාරයකින් පවත්නේ ගුරුකුලයේ බලපෑම පිට ය.

තොවිල්කවිය වෙනස් නො වී පැවැතීමට ඒවා පුස්කොළ පොත්වල ලියා තැබීම ද හේතුවිය හැකි ය. ලියාතබන ලද්දක් වෙනස් වනු දැකිය හැක්කේ කලාතුරෙකිනි. ජනකවිය මෙ සේ ලියා තැබීමක් වත් ගුරා අනුව යාමක් වත් නැති නිසාවෙන් එහි දරදඬු ස්වරූපය දකී. ගැමියා ගේ කටට හුරු උච්චාරණයට අනුව කියැවුණා පමණක් නොව ඇතැම් විට අදහස ද ප්‍රදේශයේ සිතුම් පැතුම් භාවිතාවන් අනුව වෙනස් ද වී ය. ඒ බව ඔප්පු කිරීම සඳහා සාධක අවශ්‍ය නො වන්නේ ය.

පැලේ පැල්රකින ගොවියාත් රෑ යාමයේ කරත්තයක් දක්කාගෙන දුර ගමනක් යන ගැල්කරුවාත් තනිපංගලේ පැල් කවක් හෝ කරත්ත කවක් හෝ ලතාවකට ගායනය කරන්නේ තමන් ගේ කාන්සිය නිවාගැනීමට ය. ඔහු එය ඇද පැද තාලයකට ගැයීමේ දී උදව් ලබාගන්නේ තම

නැටුමේ සිංහයා ගේ හැසිරීම දක්වා ඇත්තේ මේ ආකාරයෙනි.

පිටට නමමිනා වළිගය තබා ඉස ලෙ සේ
රකුස හරිමිනා දිව දිගු කරයි නොවල සේ
මුකය හයමිනා වටපිට බලයි නොමල සේ
කෙසර සිහ රජෙක් පැන පැන නටයි සබ මෙසේ
(සිංහ නැටුම)

සිංහයා ගේ වළිගය හැම විට ම පිටට නැමී ඇත. උගේ ඇස 'රකුස' යනුයෙන් වර්ණිත ය. ඇසෙහි ගැබ් වී ඇති බියකරු බව ධ්වනිත කිරීමට ය ඒ. ඌ රතැස හරිමින්, දිව දික් කරමින් මුකය හය හයා වටපිට බලනාකාරය මෙහි කියැවී ඇත්තේ අප ඉදිරියට සිංහයකු ගෙන එමිනි. සිංහයා ගේ තේජාන්විත බව 'කෙසර' හා 'රජෙක්' යන වචනවලින් ධ්වනිත වෙයි. සිංහයා අතුරෙනුත් සිංහයා කෙසර සිංහ නම් වෙයි. මේ එ වැනි කෙසර සිංහ රාජයෙකි.

ගිරිදේවි නැටුමේ කවි පෙළේ එන ගිරිදේවි පුවතේ හැටියට, දළ කුමරු තම සෝයුරිය තමා ගේ භාර්යාව කරගන්නා බවට බමුණෝ අනාවැකි කීහ. මේ අනුව කටයුතු සිදු වී සෝයුරිය වූ ගිරි දේවිය ලජ්ජාව ඉවසාගත නොහී සිය දිවි හානි කරගත්තා ය. එසේ දිවි හානි කරගත් ගිරි ළඳ ගේ ස්වරූප විස්තර කරන මේ කව තොවිල් කවි අතරේ දක්නට දුලබ තරමේ උසස් වූවකි.

අක්බඹ වරලස උනා වැටිච් චී
නෙත් කඳුලෙන් පියයුරි නැව්ච් චී
අත් දෙක මල්දම් සේ එල්ලිච් චී
ගිරි කුමරිය ගිරි දේවිය වෙච් චී
(ගිරිදේවි නැටුම)

'උනා වැටිච්චී' යන්නෙන් වරලස පණ නැති ව විහිද විසිර ගිය හැටි මනා ව පෙනෙයි. 'කඳුලෙන් පියයුරු නැව්ච්චී' යනු කියවත් ම ඇසින් ගැලූ කඳුළු ප්‍රමාණය කොපමණ දැ යි අපට තේරුම්ගත හැක. කඳුළෙන් පියයුරු තෙමුණා නො වේ; නැවිණි. නැවීමට තරම් සැළෙන කඳුළු ප්‍රමාණය කොයිතරම් විය යුතු ද? නානවා කියන විට දියෙන් තෙතබරි ව ඇඟට ඇලුණු ඇඳුම් පිළිබඳ චිත්තජ රූපයක් මැවෙයි. නැවුණේ පියයුරු යැ යි කිව ද නැවුණු යන වචනයේ ප්‍රබල යෙදුම අනුව නැගී ආ කඳුළෙන් මුළු ගත ම තෙමීගිය අයුරු අප සිතට නැගෙයි. ගිරිදේවිය තුළ වූ ශෝකයේ මහිමය ඉන් වඩාත් තීව්‍ර ලෙස කියවන්නාට කාවදියි. මියගිය ඇය ගේ දෑත කඩා වැටුණේ මල්දම් සේ ය. කොතරම් උචිත උපමාවක් ද? පියකරු මල් රැසක් දමයකට ඇමිණීමේ දී මල්දම එල්ලා වැටෙයි. ඇගේ අත්දෙක ද එල්ලා වැටුණේ ඒ ආකාරයට ය. ඇගේ දෑතේ පණ නැතිකම කී ආකාරය කදිම ය. මල ඇල් ලූ විට සීතලක් අතට දැනෙයි. ඇගේ මළ අතපය ද සීතල ය. අත මල්දමකට උපමා කිරීමේ දී අතෙහි වූ ශෝභනත්වය ද ව්‍යංගයෙන් කියැවුණේ වෙයි.

ගිරි දෝෂයෙන් ලෙඩ වූවකු ගේ ස්වරූපය යි මේ.

කොන්ද ඇරී උණ කෙදිරී කාමු සොරී ඇඟට බැරී
කන් පිපිරී ලේ වැගිරී බත් අපිරී කෑම බැරී
වායු පිරී කන් බිහිරී ඇස් ඇඳිරී ගමන් බැරී
........................................ ...
(ගිරි ශාන්ති බලිය)

උණ කෙදිරී, ඇඟට බැරී, බත් අපිරී, කෑම බැරී, ඇස් ඇඳිරී, ගමන් බැරී යන තැන් විමසීමෙන් දෙෂයට ලක් වූ ලෙඩා ක්‍රමක්‍රමයෙන් දුස්සාධ්‍ය රෝගී තත්ත්වයට පත් ආකාරය දත හැකි ය. උණ කෙදිරිය ගැමියා ගේ බසින් ළං වන්නේ හීන් කෙඳිරියට යි. 'මොක ද හීන් කෙඳිරියක්' යැ යි ගැමියකු අසන විට ඉන් අදහස් වන්නේ ඉතා ම දුර්වල තත්ත්වයකට පත් වී ඇති හේතුව යි. මෙය අවශ්‍යයෙන් ම ශාරීරික විය යුතු නො වේ. කායික වශයෙන් ශක්තිමත් වූවකු ගේ හිත ඉතා ම වේදනාසහගත දුර්වල විය හැක. 'මට දැන් හීන් කෙඳිරිය' යි එ විට ඔහු ගේ මුවෙන් ඉබේම පිට වෙයි. 'උණ කෙදිරී' යන්න අහවනුයේ සුළු උණක් නොව ඉතා ම දරුණු උණකි. මුලින් එ වැනි උණකින් පෙළෙන රෝගියාව ක්‍රමයෙන් ඇඟට බැරි වී, බත් අප්පිරියා වී ලෙඩේ ප්‍රතිඵලයක් වශයෙන් ඇස් ඇඳිරිය ඇති වෙයි. හතළිස් විය පසු වීමෙන් ඇති වන හතළිස් ඇඳිරිය නො ව, මේ රෝගයේ ප්‍රතිඵලයෙන් ඇති වූ ඇස් ඇඳිරිය යි. රෝගියා ගේ තත්ත්වය දුස්සාධ්‍යතම තත්ත්වයකට පත් වී ඇති ගමන් බැරී යන්නෙන් ඇඟෙයි. රෝගය මේ තත්ත්වයට පත් වූයේ ක්‍රමක්‍රමයෙනි.

ඇ ස ල ම ලී පෙති පි යලී පා ට දි ලී
පිටිපතු ලී
ඇඹිලි පෙළී සපු කැකුලී නිය බැබැළී
මුතු පබ ලී
යනෙන කලී ලෙස විදුලී මෙලෙස එලී
වෙනස දි ලී
මෙ රුව මලී දැනනොමැළී ගත සියලී
දෙස ඉගි ලී
(ගිරියකිනි බලිය)

සතර පල එලිවැට සහිත මෙම කව කතකගේ සියුමැලි බව එකවර ම සිතට නංවයි. කතක ගේ පිටිපතුල් ඇසල මල් පෙත්තක පාටින් දිළිසෙයි. මෙහි 'දිලී' යනු යෙදී ඇත්තේ ප්‍රබල ව්‍යංගාර්ථ නංවමිනි. ඇහැල මල් ළා කහ පාටින් බබළයි.

ශ්‍රවණ ඉන්ද්‍රියයෙනි. කවියේ ලයත් රිද්මයත් රැක-දෙන්නේ කණත් ගැමියා ලද පරිචයත් ය. කවියේ ලය හා තාලය පමණක් නොව ශබ්ද මාධූර්යය ද පිරිහිණි නම් කවිය රසහුන් වී ගායනයෙන් බලාපොරොත්තු වන පරමාර්ථය ඉටු නො වෙයි. පරමාර්ථ විසින් ජනකවියේත් තොවිල් කවියේත් වෙනස නිසා තොවිල්කව උසස් බවින් අඩු වන්නේ කන පිනවීමටත් රිද්මය රැකීමටත් යන මේ දෙකාරණයට ම බෙරයේ ද පිටිවහළ ලැබෙන නිසා විය හැකි ය. නැට්ටුවා ගේත් අත්වැළ කියන බෙරවාදකයා ගේත් කටහඬ යටපත් කරමින් බෙරහඬ ගුම් ගනියි. කවියේ ශබ්ද මාධූර්යය ගැන වෙහෙසීමට අනවශ්‍ය වන්නේ බෙරය නිසා ය. තොවිල් කවියෙන් කෙරෙන්නේ ජනකවියෙන් මෙන් කාන්සිය මකාගැනීම හා නිදිගැට ගතිය පළවා හැරීම නො වේ. එය අවශ්‍යයෙන් ම නැටුම හා බැඳී පවතී. තොවිල්කව, නැටුම පමණක් කළ නොහැකි ව නැටුමට ආධාර වෙනුවටත් වඩා යකුන් ප්‍රේතයන් කැඳවීමට හා පළවා හැරීමටත් උපයෝගී කරගනු ලබන්නකි. එහි වචන සමුදය මිනිසා ගේ කණට නො ව අමනුෂ්‍යයා ගේ ගොරහැඩි කන පිනවන සුළු ආකාරයෙන් යෙදී තිබිය යුතු ය. ඇතැම් විට අරුත් සැඟවුණු, කිනම් බසකට අයත් දැ යි කිය නොහැකි වූ වචන ඇතුළත් තොවිල්කවි දක්නට හැක්කේ මේ නිසා ය.

ජෝත තතරි අඩි නඩි ගත තතොහ
තතොහ තක් ගුඳ ම්
ගුඳං භ්‍රජත තතරි දිතරි අර්ග වර්ග
දික් ගුඳ ම්
ද්‍රීඩ ද්‍රීඩ ත්‍රක දිමු තරි ආයුරක්ස ජය
සුව ම්
වන්නි වන්නි සිරි ගණ හට ගිණිකොන
කළ මේ රැහු ම්

(අටකට්ටි කවක්)

මෙහි එන යම් යම් වචන ගොරහැඩි බව, කර්ණ කඨෝර බව දනවනු මිස අරුත් නො දනවයි.

ජනකවියෙන් කතාවක් කීමක් සිදු වුවොත් ඒ කලාතුරෙකිනි. ගැමියා ගේ කවිකතාව ද වෙනත් ජනකවි මෙන් ම උසස් ය. එහි කියැවෙන දේ අරුත් දනවන ධ්වනිතාර්ථ හා ව්‍යංගාර්ථ නංවන වචනයෙන් කෙටියෙන් කියා ඇත. තොවිල්කවියේ මෙන් දිගින් දිගට නො කීව ද කවි දෙක තුනකින් අදහස් රාශියක් පැවසෙයි. තොවිලය මුළු තිස් පැයක් මුළුල්ලේ, ඇතැම් විට තුන් තිස් පැයක් මුළුල්ලේ (එ නම්, දවස් එක හමාරක් තිස්සේ) පවත්වනු ලැබීම නිසා ජනකවියේ දී මෙන් කවිකතාව මෙහි දී කෙටි විය නොහැකිය. යම් කතාවක් කියනුයේ සියලු ම ආරවාරම් ඇතුළත් කොට ය.

*   *   *

ප්‍රධාන වශයෙන් ම පරමාර්ථ විසින් වෙනස්වීම හේතු කොටගෙන ජනකවිය තරම් උසස් බවක් තොවිල්කවෙහි දක්නට නොලැබිය හැකි වතුදු, සාහිත්‍යමය වශයෙන් අගය කට හැකි තොවිල් කවි ද අතරින් පතර නැත්තේ නො වේ.

රටයකුමේ එන කුළුනැටුම නටන්නා අතෙත් පයෙත් ගිගිරි වළලු පැළඳ නටයි. එයින් නඟින හඬ මේ කවෙන් ධ්වනිත නො කෙරේ ද?

කරතත් වල්ලියේ හිස පුරුදු වල්ලි යේ
ගැසූ තාලමට තුනු ඉහ නො සෙල්ලි යේ
අතෙක් පයෙක් ගිගිරි ද සෙල්ලි සෙල්ලි යේ
රොඩී කුලට නායක රත්නවල්ලි යේ

මෙහි එන 'ල'කාර හා 'ර'කාර ශබ්දයන් ගෙන් නඟින ධ්වනිය අප කනට නංවන්නේ ගිගිරි නූපුර හඬ යි. 'කරතත් වල්ලියේ', 'ගිගිරි ද සෙල්ලි සෙල්ලියේ' යන දෙතැන විමසීමෙන් මෙය වඩාත් පැහැදිලි වෙයි.

ගරවා රෞද්‍ර රකුස් වෙස්ගත් සත්ව විශේෂයකි. ගරායකා දැක්මෙන් බිය උපදවන්නෙකි. ඔහු කා තුළත් දනවන්නේ බියකි.

ඇස් දෙක කරක වා
සව්සත බීත කර වා
අඬහැර ගුගුර වා
ඇවිත් සබයට පැනපි ගරවා

(ගරා නැටුම)

යන කවෙන් ගරවා ගේ මේ ස්වරූපය කොතරම් දක්ෂ ලෙස චිත්‍රණය වේ ද? ගරවා එන්නේ ඇස් දෙක කරකව කරකවා සව්සත බීත කරමිනි. 'බීත කරවා' යන්න කියවත් ම අප ඇස් ඉදිරියෙහි මැවෙන්නේ බියෙන් ගොළු ව ගිය කෙනෙකු ගේ ස්වරූපය යි. ''අඬහැර ගුගුරවා'' යන්නේ එන 'ගුගුරවා' යන්න අපට සිහි කරන්නේ බියකරු අකුණුකෙටීම් හා අහස ගිගුරුම් සහිත මහා වැස්සකි. එ විට අප තුළ පහළවන බිය 'ගුගුරවා' යන්නෙන් මනා ව ධ්වනිත වෙයි. 'පැනපි' යන වචනය ද ප්‍රබල ලෙස යෙදුවකි. 'ඔන්න කොටිය ගමට පැන්නෝ' වැනි යමක් අපට එක්වර ම සිහි නො වේ ද? අපට සිතෙන්නේ සිටි තැනින් පැන ගොස් සැඟවීමට ය. ගරවා ගේ බියකරු ස්වරූපය මේ කවියෙන් චිත්‍රණය කොට ඇත්තේ අප තුළ මහත් බියක් දනවමිනි.

සිංහ නැටුම නම් තොවිලය යටතේ එන ගැමි

ඇගේ යටිපතුලේ ඇති මෙළෙක එය කහ පැහැති ඇහැළ මලකට සමාන කිරීමෙන් ධ්වනිත වෙයි. ඇගේ නිය 'මුතු පබළු' ය. මුතු සහ පබළු යන දෙක ම යෙදීමෙන් නියෙක සුදු පැහැය වඩාත් සිත් කාවදින ලෙස පෙන්වා තිබේ. ඇ යන්නේ 'ලෙස විදුලී' ය. විදුලිය මොහොතකින් ඇති වී නැතිවත් ම මහත් ආලෝකයකින් අවට එලිය කරයි. ඇ යන යන තැන ආලෝකමත් වන අයුරු කී හැටි අගනේ ය.

තොවිල් කවියෙහි ඒ තරම් වූ සාහිත්‍යමය අගයක් නැතත් පැරැන්නන් ගේ සිතුම් පැතුම් ඇදහුම් පිළිබඳ කරුණු හදරන ශිෂ්‍යයාට තොවිල් කවියෙන් ලැබියහැකි දැනුම අනල්ප ය. විවිධත්වයෙන් හා ශාස්ත්‍රීයත්වයෙන් කථකලි, කථක් ආදි හරත නැටුමට නෑකම් කියන පහතරට නැටුම දැනට වැටී ඇති පරිහානි මුඛයෙන් බේරාගෙන නුසුදුසු තැන් කපා කොටා උසස් ශාස්ත්‍රීය නැටුමක් බවට පත්කිරීම තරම් ම වැදගත් කටයුත්තකි තොවිලයත් සමග මැරීයන පහතරට බලි තොවිල් කවි සියල්ල එකතු කොට තැබීම.

ජාතික කෞතුකාගාර
පුස්තකාලය